# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1871/29 - 2014 ජූලි මස 16 වැනි බදාදා - 2014.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කොළඹ මහා නගර සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 71(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "ප්‍රේමකීර්ති ද අල්විස් මාවත" යනුවෙන් නැවත නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. හද්‍රානි ජයවර්ධන,
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

මහා නගර සභාව,
පුරහල,
කොළඹ 07.

උපලේඛනය

| | | |
|---|---|---|
| 01. පළාත් පාලන ආයතනයේ නම | - | කොළඹ මහා නගර සභාව |
| 02. දිස්ත්‍රික්කය | - | කොළඹ |
| 03. විථියේ වර්තමාන නම | - | නිදහස් චතුරශ්‍ර මාවතේ කොටසකි (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර එම ආයතන දෙකට පොදු ප්‍රවේශ මාර්ගය) |
| 04. අලුතින් යොදා ඇති නම | - | ප්‍රේමකීර්ති ද අල්විස් මාවත |
| 05. මාර්ග විස්තරය | - | මෙම මාර්ගය කුරුඳුවත්ත නාගරික කොට්ඨාසයට අයත් බෞද්ධාලෝක මාවත අසලින් වරිපනම් අංක 08 සහ වරිපනම් අංක 15 අතරින් ආරම්භව නිදහස් චතුරශ්‍ර මාවත අසලින් අවසන් වේ. (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර එම ආයතන දෙකට පොදු ප්‍රවේශ මාර්ගය) |

08-131

1A - G 19920— 10 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*